ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,807 – 2013 අප්‍රේල් මස 19 වැනි සිකුරාදා – 2013.04.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

තනතුරු - ඇබෑර්තු

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — බදුල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2013 මැයි මස 20 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑල් මඟින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 මාර්තු මස 25 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර	ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය
බදුල්ල	පස්සර	යටිකිඳ කොට්ඨාසයේ විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය	දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල

04-477

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය - තක්සේරු දෙපාර්තමේන්තුව

නීති නිලධාරී (විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම් මත බඳවා ගැනීම

තක්සේරු දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී තනතුරු දෙකක් සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ ක්‍රමය :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රථිඵල මත ඉහළම ලකුණු ලබාගන්නා අපේක්ෂකයින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවාගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 6 යටතේ සඳහන්) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

02. අවශ්‍ය සුදුසුකම් :

(i) අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වීම/විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

(ii) පළපුරුද්ද :
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර තුනකට (03) නොඅඩු සක්‍රිය වෘත්තීය පළපුරුද්දක් තිබීම.

(iii) කායික සුදුසුකම් :
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iv) වෙනත්
* ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
* අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
* අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට අදායක මුදල් ගෙවිය යුතු ය.

(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. නීති නිලධාරි III වන ශ්‍රේණියට බඳවාගෙන වසර 3ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007ට අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත සේවාවට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබාගත යුතු ය.

(iv) මෙම පත්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1589/30 සහ 2009.0.2.20 දින දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටියක රීති හා ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට යටත් වේ.

04. වයස් සීමාව :

ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.

05. වැටුප් පරිමාණය - මෙම තනතුරට රු. 22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1050 - රු. 53,555 මාසික වැටුප් පරිමාණයක් හිමි ය. (2006.04.25 දිනැති රා. ප. චක්‍රලේඛ අංක 6/2006 අනුව SL1-2006 වැටුප් ඛණ්ඩය).

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේ.

01	අතිරේක අධ්‍යාපන සුදුසුකම්	20
02	අතිරේක වෘත්තීය සුදුසුකම්	15
03	අතිරේක පළපුරුද්ද (ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් වසර 3ට වැඩි වෘත්තීය පළපුරුද්ද වෙනුවෙන් වසරකට ලකුණු 05 බැගින්)	30
04	ඉංග්‍රීසි භාෂා	15
05	පරිසනක හැකියාව, තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම	15
06	සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව	05
	මුළු ලකුණු	100

සටහන :-

(i) සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අය පමණි.

(ii) සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත්‍රය,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

08.

(අ) අයදුම්පත් 2013.05.20 දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
ලේකම්,
මූදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
මහලේකම් කාර්යාලය,
කොළඹ 01.

(ආ) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ, අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස්කර මුල් පිටුව අංක 01 සිට 08 දක්වාත්, 02 වන පිටුව අංක 09 - 11 දක්වාත් 03 වන පිටුව අංක 12 (1) - 12(11) දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(ඇ) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙලවරේ "තක්සේරු දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(ඈ) අයදුම්පතුයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥවරයකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු හෝ රු. 22,935 ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

(ඉ) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතු ය.

(ඊ) මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

09. සාවද්‍ය තොරතුරු සැපයීම :

ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,
ලේකම්,
මූදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය,
මහලේකම් කාර්යාලය,
කොළඹ 01.

04-651

විභාග, විභාග ප්‍රතිඵල ආදිය

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහාවන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2012 (2013)

ඉහත සේවාවේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2013 අගෝස්තු මස ආරම්භ කොට පේරාදෙණියේදී පැවැත්වීමට අපේක්ෂා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. මේ සඳහා 2012 වසරේ දෙසැම්බර් මස 31 වැනි දිනට ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ සිටි නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙකටම එකවර ඉදිරිපත්වීමට හැකිවන පරිදි කාලසටහන් සකස් කරනු ලැබේ.

03. විෂය නිර්දේශය.—I වැනි කාර්යක්ෂමතා කඩඉම් පාලනය කරන විෂය නිර්දේශ පත්‍ර හා අනෙකුත් විධිවිධාන සේවා ව්‍යවස්ථාවේ සඳහන් කර ඇත. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග I සඳහා වන විෂය නිර්දේශ ඇමුණුම "අ" හි සඳහන් කර ඇත.

කාර්යක්ෂමතා කඩඉම් විභාගවල විෂයයන් සඳහා පෙනී සිටීමේ දී එක් වරක දී හෝ වාර කිහිපයක දී හෝ පෙනී සිටිය හැක.

04. මෙම සේවාවේ නිලධාරීන් I වන කාර්යක්ෂමතා කඩඉම සඳහා පෙනී සිටිය යුතු විෂයයන් මෙසේය. :

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය
I වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය

විෂය අංකය	විෂයය	කාල සීමාව (පැය)
01	මූල්‍ය ක්‍රම	03
02	පරිපාලනය	03
03	දෙපාර්තමේන්තු රෙගුලාසි ප්‍රශ්න පත්‍රය - I	02
04	දෙපාර්තමේන්තු රෙගුලාසි ප්‍රශ්න පත්‍රය - II	03
05	විශේෂ ප්‍රශ්න පත්‍රය*	03

* මේ සඳහා අයැදුම් කළ යුත්තේ පශු පර්යේෂණ නිලධාරීන් පමණි.

05. පහත උපටා දක්වා ඇති 1966 සැප්තැම්බර් මස 04 වැනි දින හා අංක 701 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5 වැනි ඡේදය කෙරෙහි මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට පෙනී සිටින නිලධාරීන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

දෙපාර්තමේන්තුගත විභාගවලට (උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාග ඇතුළුව) මාධ්‍ය විය යුත්තේ නිලධාරියා රජයේ සේවයට ඇතුළුවීමට පෙනී සිටි තරග විභාගයේ මාධ්‍ය හෝ රාජ්‍ය භාෂාවයි. තරග විභාගයක් නොමැතිව මුලින්ම සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් වූ විට උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට මාධ්‍ය විය යුත්තේ නිලධාරියා සේවයට බැඳීමට සුදුසුකම්ලත් භාෂාව හෝ රාජ්‍ය භාෂාව ය.

06. මේම විභාගය සඳහා සිංහලෙන්, දෙමළෙන් හෝ ඉංග්‍රීසියෙන් උත්තර සැපයීමට අපේක්ෂකයින්ට හැකිවනු සඳහා විභාග කොමසාරිස් ජනරාල් විධිවිධාන සලස්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

07. අපේක්ෂකයන් තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගවලට පෙනී සිටින බැව් පසුව හෙළිවුවහොත්, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

08. ඉල්ලුම්පතු අමුනා ඇති ආකෘතියට අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කොට ඉදිරිපත් කළ යුතු ය. එම කඩදාසියේ දෙපැත්තම පාවිච්චි කළ යුතු ය. ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 08 තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවට ද, වන ලෙස සකස් කළ යුතු වේ. ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතු ය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පතුත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින් එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයැදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයැදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එසේ නොවුනහොත් අයැදුම්පත ප්‍රතික්ෂේප කිරීමට සිදුවේ. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය.

09. විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාග පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීතිරීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වූ නීතිරීති මෙම නිවේදනයේ අග පළකොට ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

10. ඉල්ලුම්පත්‍ර 2013 මැයි මස 23 දිනට හෝ ඊට ප්‍රථම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. මේදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
ගැටඹේ,
පේරාදෙණිය.

11. අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍ර නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. ඔබ වෙත තබාගත් අයැදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද, සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 මැයි මස 10 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 අප්‍රේල් මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

පී. එච්. එල්. වී. ද සිල්වා,
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.).

2013 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

12. ඉහත II වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියකියවිලි සලකා බලනු නොලැබේ.

13. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවල දී විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණකි.

14. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන්ගෙන් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු අය කිරීමට තීරණය කර ඇත. :—

(අ) පළමු වතාවට සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.

(ආ) ඉන්පසු එක් එක් වතාව සඳහා

	රු. ශත
සම්පූර්ණ විභාගය සඳහා	1000 0
එක් විෂයයකට	500 0

මෙම විභාගයට දැනටමත් පෙනී සිටි අපේක්ෂකයින්ට ඉහත දැක්වෙන පරිදි අදාළ ගාස්තු ගෙවීමට නියම වේ. මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003.02.13ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ ගෙවා ලබාගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයක ඇලවිය යුතුය. තවද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ද ප්‍රයෝජනවත් විය හැක.

15. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

කේ. එම්. ටී. කෑදරගම,
ලේකම්,
පශු සම්පත් සහ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය.

2013 මාර්තු මස වැනි දින,
පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය,
අංක 45,
ශාන්ත මයිකල් පාර,
කොළඹ 03.

ආදර්ශ අයදුම්පත්‍රය

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2012 (2013)

First Efficiency Bar Examination for Officers in the Sri Lanka Animal Production and Health Service– 2012 (2013)

(විභාගයේ නම ලිපි කවරයේ වමත් පස ඉහළ කෙළවරේ දැක්විය යුතුය.)

නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : සිංහල - 2 ☐ දෙමළ - 3 ☐ ඉංග්‍රීසි - 4 ☐

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

01. (අ) මුල්කුරු අගට යොදා මුල් අකුරු සමග නම :————. (උදා : NIMALSIRI K. A.)

(ආ) මුල් අකුරුවලින් හැඳින්වෙන නම :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

02. උපන් දිනය :

වර්ෂය: ☐☐☐☐ මාසය: ☐☐ දිනය: ☐☐

03. පදවි නාමය :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
දෙපාර්තමේන්තුවේ නම :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

04. ලිපිනය (ප්‍රවේශ පත්‍ර එවීම සඳහා) (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

05. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවට පත්කරන ලද දිනය :————.

06. නිවේදනයේ 04 වැනි ඡේදයේ දක්වා ඇති, විෂය අංක සහිතව පෙනී සිටීමට අපේක්ෂිත විෂයයන් (පැහැදිළිව සඳහන් කළ යුතුය.) :

(i) විෂය අංකය : ☐☐ විෂයය :————.
(ii) විෂය අංකය : ☐☐ විෂයය :————.
(iii) විෂය අංකය : ☐☐ විෂයය :————.
(iv) විෂය අංකය : ☐☐ විෂයය :————.
(v) විෂය අංකය : ☐☐ විෂයය :————.

07. මීට පළමු මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම්, විෂයයන්ද, වර්ෂය හා මාසය ද සඳහන් කරන්න. :————.

08. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉල්ලුම්පත්‍රයේ ඉහළින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

09. ගෙවන ලද විභාග ගාස්තුව : රු.
ගෙවන ලද කාර්යාලය :————. රිසිට්පත් අංකය :————.

ලදුපත ඇලවීම සඳහා
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න)

————,
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :————.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් මගින්
විභාග කොමසාරිස් ජනරාල්,
ඉදිරිපත් කරමි.

මෙම විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත්, මම සහතික කරමි.

*අපේක්ෂකයා/අපේක්ෂිකාව නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බවද සහතික කරමි. අපේක්ෂකයාගේ අත්සන සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය.

දිනය :————.

(*ගාස්තුව නොගෙවෙන විට දී කපා දැමිය යුතුය.)

"අ" ඇමුණුම

(අ) ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වූ 1වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත වේ :–

1. මූල්‍ය ක්‍රම
2. පරිපාලනය
3. දෙපාර්තමේන්තු රෙගුලාසි - I
4. දෙපාර්තමේන්තු රෙගුලාසි - II

1. මූල්‍ය ක්‍රමය

මූල්‍ය ක්‍රම පිළිබඳ විභාගය පහත සඳහන් කරුණු මත පදනම් කරනු ලැබේ :–

(අ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි 1 වැනි කාණ්ඩය (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවේ මුදල් රෙගුලාසි - X වැනි පරිච්ඡේදය හැර)

(ආ) ගෙවී යන වර්ෂයේ ඇස්තමේන්තුගත (උදා : ඒවා සකස් කිරීම, ශීර්ෂ මූල්‍ය ක්‍රම සහ විසර්ජන පනත්)

(ඇ) කච්චේරි මඟින් විශේෂයෙන් කරගෙන යනු ලබන ගිණුම් පිළිබඳ ආඥා පනත්

* සටහන : සාමාර්ථය සඳහා මුළු ලකුණුවලින් 40%ක් අපේක්ෂකයකු විසින් ලබාගත යුතු ය.

2. පරිපාලනය

පරිපාලනය පිළිබඳ විභාගය පහත සඳහන් කරුණු මත පදනම් කරනු ලැබේ.

(අ) කාර්යාල හා ක්ෂේත්‍ර සංවිධාන ක්‍රම

(ආ) ආයතන සංගුහය : පරිච්ඡේද I, II, III, V, VI, VII, IX, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII

* සටහන : සාමාර්ථය සඳහා මුළු ලකුණුවලින් 40%ක් අපේක්ෂකයකු විසින් ලබාගත යුතු ය.

3. දෙපාර්තමේන්තු රෙගුලාසි - I

දෙපාර්තමේන්තු රෙගුලාසි පිළිබඳ විභාගය පහත සඳහන් කරුණු මත පදනම් කරනු ලැබේ :–

මෙම ප්‍රශ්න පත්‍රය පහත විෂයයන්ගෙන් සමන්විත පැය 02ක ප්‍රශ්න පත්‍රයකි. සත්ත්ව පනත යටතේ ඇති ස්පර්ශයෙන් බෝවන රෝග සඳහා වූ ආඥා පනත, සත්ත්ව පනත, දෙපාර්තමේන්තු නියෝග හා පශු වෛද්‍ය සේවයට අදාළ චක්‍රලේඛ.

* සටහන : සාමාර්ථය සඳහා මුළු ලකුණුවලින් 40%ක් අපේක්ෂකයකු විසින් ලබාගත යුතු ය.

4. දෙපාර්තමේන්තු රෙගුලාසි - II

මෙම ප්‍රශ්න පත්‍රය පහත විෂයයන්ගෙන් සමන්විත පැය 03ක ප්‍රශ්න පත්‍රයකි:–

(අ) නිදර්ශක බෙදාහැරීම පශ්චාත් මරණ පරීක්ෂණ ඇතුළු රසායනාගාර හඳුනාගැනීම්, ගැබ් පරීක්ෂාව ඇතුළු හඳුනාගැනීම් පරීක්ෂණ, බෝවන රෝග, ස්පර්ශයෙන් බෝවන රෝග සඳහා එන්නත් හා මස්තු පරීක්ෂාව ;

(ආ) කෘත්‍රිම සිංචන ක්‍රමවේදය හා එහි භාවිතය, වසුපැටවුන් බෝකිරීම හා ඇතිදැඩි කිරීමේ මූලධර්ම, බීජෞෂනය මඟින් පැටවුන් ලබාගැනීම හා ඇතිදැඩිකිරීම, සත්ත්ව පෝෂණය, පශු සම්පත් සඳහා ආහාර වේල හා එහි භාවිතය, පෝෂ්‍ය තෘණ වගාව වියළි තෘණ සහ සයිලේජ් සැකසීම හා පශු සම්පත් කළමනාකරණය

(ඇ) කිරි නිෂ්පාදනය, පැස්චරිකරණය කරන ලද කිරි බෝතල් කිරීම හා ප්‍රවාහනය, කිරිවල සෞඛ්‍ය ආරක්ෂිත බව, කිරිවල බැක්ටීරියා, මේදය, කිරි විශ්ලේෂණය ඇතුළුව පරීක්ෂා කිරීම, යොදය වෙන්කිරීම, බටර්, ගිතෙල් හා මී කිරි නිෂ්පාදනය

(ඈ) ඝාතනාගාර සතුන් ඝාතනය කිරීම, මාංශ හඳුනාගැනීම් ඇතුළුව මාංශ පරීක්ෂා කිරීම

* සටහන : සාමාර්ථය සඳහා මුළු ලකුණුවලින් 40%ක් අපේක්ෂකයකු විසින් ලබාගත යුතු ය.

04-641/1

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2012 (2013)

ඉහත සේවාවේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2013 අගෝස්තු මස ආරම්භ කොට පේරාදෙණියේ දී පැවැත්වීමට අපේක්ෂා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. මේ සඳහා 2012 වසරේ දෙසැම්බර් මස 31 වැනි දිනට ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ සිටි නිලධාරීන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ.

02. කාර්යක්ෂමතා කඩඉම් විභාග තුනටම එකවර ඉදිරිපත්වීමට හැකිවන පරිදි කාලසටහන් සකස් කරනු ලැබේ.

03. විෂය නිර්දේශය.—II වැනි කාර්යක්ෂමතා කඩඉම් පාලනය කරන විෂය නිර්දේශ පත්‍ර හා අනෙකුත් විධිවිධාන සේවා ව්‍යවස්ථාවේ සඳහන් කර ඇත. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග II සඳහා වන විෂය නිර්දේශ ඇමුණුම "අ" හි සඳහන් කර ඇත.

කාර්යක්ෂමතා කඩඉම් විභාගවල විෂයයන් සඳහා පෙනී සිටීමේ දී එක් වරක දී හෝ වාර කිහිපයක දී හෝ පෙනී සිටිය හැක.

04. මෙම සේවාවේ නිලධාරීන් II වැනි කාර්යක්ෂමතා කඩඉම් සඳහා පෙනී සිටිය යුතු විෂයයන් මෙසේය. :

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය
II වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය

විෂය අංකය	*විෂයය*	*කාල සීමාව (පැය)*
01	කොටස් 01 03	
02	කොටස් 02	03
03	කොටස් 03 - ප්‍රශ්න පත්‍රය I	03
04	කොටස් 03 - ප්‍රශ්න පත්‍රය II	03
05	කොටස් 03 - ප්‍රශ්න පත්‍රය III	03
06	කොටස් 03 - ප්‍රශ්න පත්‍රය IV	03
07	කොටස් 03 - ප්‍රශ්න පත්‍රය V	03
08	කොටස් 03 - ප්‍රශ්න පත්‍රය VI	03
09	කොටස් 03 - ප්‍රශ්න පත්‍රය VII	03
10	කොටස් 03 - ප්‍රශ්න පත්‍රය - VIII	03
11	කොටස් 03 - ප්‍රශ්න පත්‍රය - IX	03
12	කොටස් 03 - ප්‍රශ්න පත්‍රය - X	03
13	කොටස් 03 - ප්‍රශ්න පත්‍රය - XI	03

සටහන.—II වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ අයැදුම්කරුවන් පෙනී සිටිය යුත්තේ කොටස් 01 හෝ කොටස් 02 යන ප්‍රශ්න පත්‍ර දෙකින් එකකට හා 03හි සඳහන් ප්‍රශ්න පත්‍ර XI න් ප්‍රශ්න පත්‍ර දෙකකට පමණි. සාමාර්ථය සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට අවම වශයෙන් ලකුණු 40% ක් ලබාගත යුතුය.

05. පහත උපුටා දක්වා ඇති 1966 සැප්තැම්බර් මස 04 වැනි දින හා අංක 701 දරන හාණ්ඩාගාර චක්‍රලේඛයේ 5 වැනි ඡේදය කෙරෙහි මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට පෙනී සිටින නිලධාරීන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

දෙපාර්තමේන්තුගත විභාගවලට (උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාග ඇතුළුව) මාධ්‍ය විය යුත්තේ නිලධාරියා රජයේ සේවයට ඇතුළුවීමට පෙනී සිටි තරග විභාගයේ මාධ්‍ය හෝ රාජ්‍ය භාෂාවයි. තරග විභාගයක් නොමැතිව මුලින්ම සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් වූ විට උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට මාධ්‍ය විය යුත්තේ නිලධාරියා සේවයට බැඳීමට සුදුසුකම්ලත් භාෂාව හෝ රාජ්‍ය භාෂාව ය.

06. මේම විභාගය සඳහා සිංහලෙන්, දෙමළෙන් හෝ ඉංග්‍රීසියෙන් උත්තර සැපයීමට අපේක්ෂකයින්ට හැකිවනු සඳහා විභාග කොමසාරිස් ජනරාල් විධිවිධාන සලස්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

07. අපේක්ෂකයන් තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගවලට පෙනී සිටින බැව් පසුව හෙළිවුවහොත්, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

08. ඉල්ලුම්පත්‍ර අමුනා ඇති ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කොට ඉදිරිපත් කළ යුතු ය. එම කඩදාසියේ දෙපැත්තම පාවිච්චි කළ යුතු ය. ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 08 තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවට ද, වන ලෙස ගෙන සකස් කළ යුතු වේ. ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින් එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයැදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට සිදුවේ. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

09. විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාග පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීතිරීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වූ නීතිරීති මෙම නිවේදනයේ අග පළකොට ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

10. ඉල්ලුම්පත්‍ර 2013 මැයි මස 23 දිනට හෝ ඊට පෙර සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
ගැටඹේ,
පේරාදෙණිය.

11. අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයැදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද, සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

12. ඉහත II වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියකියවිලි සලකා බලනු නොලැබේ.

13. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලදී විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණකි.

14. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන්ගෙන් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු අය කිරීමට තීරණය කර ඇත. :—

(අ) පළමු වතාවට සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.

(ආ) ඉන්පසු එක් එක් වතාව සඳහා-

	රු. ශත
සම්පූර්ණ විභාගය සඳහා	1,000 0
එක් විෂයයකට	500 0

මෙම විභාගයට දැනටමත් පෙනී සිටි අපේක්ෂකයින්ට ඉහත දැක්වෙන පරිදි අදාළ ගාස්තු ගෙවීමට නියම වේ. මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003.02.13ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ ගෙවා ලබාගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයක ඇලවිය යුතුය. තව ද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ද ප්‍රයෝජනවත් විය හැක.

15. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

කේ. එම්. ටී. කෑදරගම,
ලේකම්,
පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය.

2013 මාර්තු මස වැනි දින,
පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය,
අංක 45,
ශාන්ත මයිකල් පාර,
කොළඹ 03.

ආදර්ශ අයදුම්පත්‍රය

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහාවන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2012 (2013)

Second Efficiency Bar Examination for Officers in the Sri Lanka Animal Production and Health Service 2012 (2013)

(විභාගයේ නම ලිපි කවරයේ වමත් පස ඉහළ කෙළවරේ දැක්විය යුතුය.)

නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : සිංහල - 2 ☐ දෙමළ - 3 ☐ ඉංග්‍රීසි - 4 ☐

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

01. (අ) මුලකුරු අගට යොදා මුල් අකුරු සමග නම :————. (උදා : Nimalsiri K. A.)

(ආ) මුල් අකුරුවලින් හැඳින්වෙන නම :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

02. උපන් දිනය :

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

03. පදවි නාමය :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
දෙපාර්තමේන්තුවේ නම :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

04. ලිපිනය (ප්‍රවේශපත්‍ර එවීම සඳහා) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

05. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවට පත්කරන ලද දිනය :————.

06. නිවේදනයේ 04 වන ඡේදයේ දක්වා ඇති, විෂය අංක සහිතව පෙනී සිටීමට අපේක්ෂිත විෂයයන් (පැහැදිළිව සඳහන් කළ යුතුය.) :

(i) විෂය අංකය ☐☐ විෂයය :————.
(ii) විෂය අංකය ☐☐ විෂයය :————.
(iii) විෂය අංකය ☐☐ විෂයය :————.
(iv) විෂය අංකය ☐☐ විෂයය :————.
(v) විෂය අංකය ☐☐ විෂයය :————.

07. මීට පළමු මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම්, විෂයයන් ද, වර්ෂය හා මාසය ද සඳහන් කරන්න. :————.

08. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉල්ලුම්පත්‍රයේ ඉහළින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

09. ගෙවන ලද විභාග ගාස්තුව රු. :
ගෙවන ලද කාර්යාලය :————. රිසිට්පත් අංකය :————.

ලදුපත ඇලවීම සඳහා
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න.)

————,
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :————.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් මගින්
විභාග කොමසාරිස් ජනරාල්,
ඉදිරිපත් කරමි.

මෙහි විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත්, මම සහතික කරමි.

*අපේක්ෂකයා/අපේක්ෂිකාව නියමිත විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බව ද සහතික කරමි. අපේක්ෂකයාගේ අත්සන සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය.

දිනය :————.

(*ගාස්තුව නොගෙවෙන විට දී කපා දැමිය යුතුය.)

ඇමුණුම (අ)

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වූ II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත වේ :–

1 කොටස : මෙය විෂය නිර්දේශය 2.1, 2.2, 4.1, 4.2, 5.2, 5.8, 6.5, 7.2.1, 8.2, 8.2.2., 8.2.3, 8.3.1, 9.2, 9.4, 9.6, 9.7 කොටස්වලින් සමන්විත වේ. විෂය නිර්දේශය පේරාදෙණිය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ, අධ්‍යක්ෂ ජනරාල්ගෙන් හා සියලුම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල පළාත් අධ්‍යක්ෂවරුන්ගෙන් ලබාගත හැකිය.

2 කොටස : මෙම විෂය නිර්දේශය 1.1.1, 1.1.4, 1.2.1, 3.2, 3.1.1, 3.1.2, 3.2.1, 10.1.1, 10.1.2, 10.1.3, 10.1.4, 10.1.6, 10.2.1, 10.2.8 හා 10.4.1 කොටස්වලින් සමන්විත වේ. විෂය නිර්දේශය පේරාදෙණිය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් හා සියලුම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල පළාත් අධ්‍යක්ෂවරුන්ගෙන් ලබාගත හැකිය.

3 කොටස : ප්‍රශ්න පත්‍රය I - ව්‍යාධි විද්‍යාව
ප්‍රශ්න පත්‍රය II - පශු සම්පත් ආර්ථික විද්‍යාව
ප්‍රශ්න පත්‍රය III - පශු මහජන සෞඛ්‍ය

ප්‍රශ්න පත්‍රය IV	-	කෘෂි ව්‍යාප්තිය
ප්‍රශ්න පත්‍රය V	-	ඖන විද්‍යාව හා අභිජනනය
ප්‍රශ්න පත්‍රය VI	-	සත්ත්ව කායික විද්‍යාව හා ප්‍රජනනය
ප්‍රශ්න පත්‍රය VII	-	සත්ත්ව නිවාසකරණය හා කළමනාකරණය
ප්‍රශ්න පත්‍රය VIII	-	සත්ත්ව පෝෂණය
ප්‍රශ්න පත්‍රය IX	-	තෘණ හා ගෝචර තෘණ
ප්‍රශ්න පත්‍රය X	-	ව්‍යවහාරික පශු ක්ෂුද්‍රජීව විද්‍යාව හා ප්‍රතිශක්තිකරණ විද්‍යාව
ප්‍රශ්න පත්‍රය XI	-	ව්‍යවහාරික, වෛද්‍ය විද්‍යාව, ව්‍යාධිවේදය හා පරපෝෂිත වේදය

* සටහන.- සාමාර්ථය සඳහා මුළු ලකුණුවලින් 40% අපේක්ෂකයකු විසින් ලබාගත යුතුය.

විස්තර පේරාදෙණිය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් හා සියලුම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල පළාත් අධ්‍යක්ෂවරුන්ගෙන් ලබාගත හැකිය.
04-641/2

අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1, 2 - I, 2 -II හා 3 වන පන්තිවල නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1, 2 -I, 2-II හා 3 වැනි පන්තිවල නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013 අගෝස්තු මස කොළඹ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම විභාගවලට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 1086/26 දරන 1999.07.02 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකර ඇත. අයදුම්කරුවන්ගේ පහසුව සඳහා එම විෂය නිර්දේශය සහ අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත. (වයස අවුරුදු 45 ඉක්මවූ නිලධාරීන්ට කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස්වීමට හැකිවන අයුරින් ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවේ 27 වන ඡේදයේ ඇ වගන්තියෙන් සලසා තිබූ විධිවිධානයන් 2001.09.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 20/2001 අංක දරන චක්‍රලේඛයෙන් අහෝසි කර ඇති බැවින්, විදුහල්පති සේවයට අයත් සියලුම නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් විය යුතුවේ.)

(අ) විභාග පරිපාටිය - කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂයයන් පහත දැක්වේ. :-

විෂය අංක 01 ආයතන සංග්‍රහයේ විධිවිධාන—
1 වන කොටස - බහුවරණ ප්‍රශ්න 50 යි - කාලය පැය 01 යි ලකුණු 50 යි
2 වන කොටස - ව්‍යුහගත ප්‍රශ්න පත්‍රයකි - කාලය පැය 01 යි ලකුණු 50 යි

විෂය අංක 02 පාසල්වල මූල්‍ය පරිපාලනය—
1 වන කොටස - බහුවරණ ප්‍රශ්න 50 යි- කාලය පැය 01 යි ලකුණු 50 යි
2 වන කොටස - ව්‍යුහගත ප්‍රශ්න පත්‍රයකි - කාලය පැය 01 යි ලකුණු 50 යි

විෂය අංක 03 අධ්‍යාපන පරිපාලනය හා අධීක්ෂණය—
1 වන කොටස - බහුවරණ ප්‍රශ්න 50 යි - කාලය පැය 01 යි ලකුණු 50 යි
2 වන කොටස - ව්‍යුහගත ප්‍රශ්න පත්‍රයකි - කාලය පැය 02 යි ලකුණු 50 යි

අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු ඇතුළුව අමාත්‍යාංශය සහ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල සහ ආයතනවල සංවිධානය සහ කාර්යයන් පාසල් පරිපාලනය, පාසල් හා සමාජය අතර සම්බන්ධතා, පාසල් අධීක්ෂණය සහ ගුරුවරුන්ගේ කාර්ය සාධනය ඇගයීම සහ ජාතික, ප්‍රාදේශීය හා පාසල් මට්ටමේ අධ්‍යාපන සැලසුම්කරණය.

03. සාමාර්ථයන් ලැබීම සඳහා අපේක්ෂකයකු ඉල්ලුම් කරන එක් එක් විෂයයකට අවම වශයෙන් 40% ක හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

04. විභාගයේ භාෂා මාධ්‍යය :- සිංහල/දෙමළ/ඉංග්‍රීසි(ඉල්ලුම් කරන මාධ්‍ය වෙනස් කරනු නොලැබේ)
(i) අපේක්ෂයකුට රාජ්‍ය භාෂාවෙන් පිළිතුරු ලිවිය හැක;
හෝ
(ii) අපේක්ෂකයා රාජ්‍ය සේවයට ඇතුළුවීම සඳහා පෙනී සිටි තරඟ විභාගයේ භාෂා මාධ්‍ය හෝ තරඟ විභාගයක් නොමැතිව රාජ්‍ය සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් ඔවුන් රජයේ සේවයට ඇතුළුවීමට සුදුසුකම් ලැබූ භාෂා මාධ්‍යයෙන් පිළිතුරු ලිවිය හැක.

05. යම්කිසි අපේක්ෂකයෙකුට තමන්ට හිමිකමක් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් අනාවරණය වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

5.1 විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. විභාගාපේක්ෂයින් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු නොකරනු ඇත.

06. පහත දැක්වෙන ආකෘතියට අනුව, ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවැනි පිටුවට ද ඉතිරිය දෙවැනි පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර, ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතු ය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍රයත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම් පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, එම ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති බව දන්වමි. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු ය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කරන බව වැඩි දුරටත් සඳහන් කරමි. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය බව දන්වමි.

07. විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පවත්වනු ලබන අතර, එය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වන නීති රීති මෙම නිවේදනය අවසානයේ පළකොට ඇත.

08. ඉල්ලුම්පත් 2013 මැයි මස 20 වැනි දින හෝ ඊට ප්‍රථම බත්තරමුල්ල, පැලවත්ත, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් වෙත ලැබෙන පරිදි විදුහල්පති/කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් ඔබේ සේවා ප්‍රධානියා මගින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. මේදිනට පසු ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළකරනු ඇත. නිවේදනය පළ වී දින 2 හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද ලියාපදිංචි කළ කුවිතාන්සිය ද කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලුම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

(i) විභාගයේ නම :————.
(ii) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :————.
(iii) අපේක්ෂකයාගේ සම්පූර්ණ ලිපිනය :————.
(iv) ඉල්ලුම්පත්‍රය තැපැල් කළ දිනය, ලියාපදිංචි කළ අංකය හා තැපැල් කාර්යාලය :————.
(v) නුවරුවෙ සිටින අයට පණිවුඩකරුවෙකු මගින් විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දෙන ලෙස උපදෙස් දෙනු ලැබේ.

10. ඉහත 08 වන ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ (පසුව ඉදිරිපත් කරනු ලබන) පැමිණිලි සලකා බලනු නොලැබේ.

11. විභාග ශාලාවේ දී තමන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වේ. ඒ සඳහා,—
(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණක් පිළිගනු ලැබේ.

12. විභාග ගාස්තු :—
(අ) මෙම විභාගය සඳහා අයකරන ලද ගාස්තු මොනයම් හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන අතර වෙනත් විභාගයක ගාස්තුවකට මාරු කිරීමට ද ඉඩදෙනු නොලැබේ.

(ආ) සම්පූර්ණ විභාගය හෝ ඉන් කොටසක් සඳහා හෝ පළමුවැනි වතාවේ දී ගාස්තු අය කරනු නොලැබේ.

(ඇ) ඊට පසු එක් එක් වතාව සඳහා අය කෙරෙන ගාස්තු පහත දැක්වේ. —

සම්පූර්ණ විභාගය සඳහා රු. 400
එක් විෂයයක් සඳහා රු. 200

මුළු විභාගය සඳහා විභාග ගාස්තුව රුපියල් 400 ක් ද, එක් විෂයයක් සඳහා රුපියල් 200 ක් වන බවත්, විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂයට 2003-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැළෙවෙන සේ අලවා එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

13. විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇති බව දන්වමි.

එස්. එම්. ගෝඨාභය ජයරත්න,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2013 අප්‍රේල් මස 19 වැනි දින,
පැලවත්ත, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ ඉල්ලුම් පත්‍රය

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1, 2-I 2-II හා 3 පන්තිවල නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013

Efficiency Bar Examination for officers in class 1, 2-I, 2-II & 3 in Sri Lanka Principals Service - 2013

(විදුහල්පති/කොට්ඨාස/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් බත්තරමුල්ල, පැලවත්ත, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කරන්න. විභාගයේ නම කවරයේ වමත් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.)

01. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
සිංහල - 2 ☐
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

02. (අ) මුලකුරු අගට යොදා මුලකුර සමග නම :————.
(මූලකුරු සමග ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(උදා :- SILVA H. A.)
(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

03. ලිපිනය :
(i) පෞද්ගලික :————.
(ii) රාජකාරී :————.
(iii) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

04. (i) විදුහල්පති සේවයේ පන්තිය/ශ්‍රේණිය :————.
(ii) පාසල/කාර්යාලය :————.
(iii) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව/කලාප අධ්‍යාපන කාර්යාලය :————.

05. (i) ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

(ii) උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

06. ගැසට් නිවේදනයේ 02 වන ඡේදයේ (අ) යටතේ දක්වා ඇති විෂයය අංකය සහිතව අයදුම් කරනු ලබන විෂයයන් :

විෂය අංකය 01 - ආයතන සංග්‍රහයේ විධිවිධාන ☐
විෂය අංකය 02 - පාසල්වල මුදල් පරිපාලනය ☐
විෂය අංකය 03 - අධ්‍යාපන පරිපාලනය හා අධීක්ෂණය ☐

අදාළ විෂය අංකය/අංක කොටුව/කොටු තුළ ලියන්න.

07. මීට ප්‍රථම මෙම විභාගයට සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් හෝ පෙනී සිට තිබේදැයි සඳහන් කරන්න. එසේ නම් විෂය ද විෂය අංකය ද වසර සහ මාධ්‍ය ද සඳහන් කරන්න.

විෂය	*විෂය අංකය*	*වසර*	*මාධ්‍යය*

08. විභාග ගාස්තු ගෙවා ලබා ගත් ලදුපතේ විස්තර
ලදුපත් අංකය :————.
ප්‍රාදේශීය/දිස්ත්‍රික් ලේකම් කාර්යාලය :————.
දිනය :————.

ලදුපත මෙහි අලවන්න.

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව ප්‍රකාශ කරමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මා එකඟ වෙමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

විභාග කොමසාරිස් ජනරාල්,

ඉහත විස්තර දැක්වෙන අපේක්ෂකයා මාගේ පාසලේ/කාර්යාලයේ නිලධාරියෙකු වන බව, මම සහතික කරමි. තවද, අපේක්ෂකයා විභාග ගාස්තු සඳහා වන ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
විදුහල්පති/කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන
(විදුහල්පතිවරයෙකු නම් පාසලේ නම සඳහන් කරන්න.)

ලිපිනය :————.

දිනය :————.

(අදාළ නොවන වචන කපා හරින්න.)
04-478

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

ඌව පළාත්බද මහාධිකරණය - මොණරාගල

මොණරාගල මහාධිකරණය මගින්, මොණරාගල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය මගින් හා වැල්ලවාය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජ සන්තක කරන ලද මෝටර් වාහන ටෙන්ඩර් මගින් විකිණීම සඳහා 2013.04.19 වැනි දින සිට 2013.05.15 වැනි දින දක්වා ටෙන්ඩර් අයදුම්පත් භාර ගනු ලැබේ.

02. පහත අංක සඳහන් වාහන ටෙන්ඩර් සඳහා නියම කොට ඇත. එක් එක් වාහනය සඳහා ටෙන්ඩර් පත් වෙන වෙනම ඉදිරිපත් කළ යුතු අතර, ඒ සඳහා ආපසු නොගෙවෙන රු. 100 ක ටෙන්ඩර් ගාස්තුවක් ගෙවා නියමිත ආකෘති පත් හා විස්තර මොණරාගල මහාධිකරණ ගිණුම් අංශයෙන් ලබාගත යුතු ය. ටෙන්ඩර් අයදුම්පත් නිකුත් කරනු ලබන්නේ 2013.04.19 වැනි දින සිට 2013.05.15 වැනි දින දක්වා පමණි.

03. ආපසු ගෙවනු ලබන රු. 5,000 ක ටෙන්ඩර් තැන්පතුවක් ද මොණරාගල මහාධිකරණයේ තැන්පත් කළ යුතු ය. ටෙන්ඩර් පත්‍රය සමග මුදල් ගෙවන ලද කුවිතාන්සියේ ඡායා පිටපතක් ද අමුණා එවිය යුතු අතර, ටෙන්ඩර්පත් එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ "වාහන සඳහා මිල ගණන්" වාහන අංක ..... යනුවෙන් සඳහන් කර මොණරාගල මහාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් භාර දිය යුතු ය.

04. වාහන පරීක්ෂා කිරීම 2013.04.19 වැනි දින සිට 2013.05.15 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල දී පළමු වන අංක දරන වාහනය මොණරාගල මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගෙන් හා දෙවන හා තුන්වන අංක දරන වාහන මොණරාගල දිසා මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරියගෙන් හා හතරවන හා පස්වන අංක දරන වාහන වැල්ලවාය දිසා මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරියගේ පූර්ව අනුමැතිය ඇතිව කාර්යාල වේලාව තුළ දී පරීක්ෂා කළ හැකිය.

05. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර්කරුවන්ට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගිවිය හැකි අතර, 2013.05.16 වැනි දින ප. ව. 2.00 ට මොණරාගල ඌව පළාත්බද මහාධිකරණයේ දී ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ.

06. ලියාපදිංචි තැපෑලෙන් දැනුම්දීම ලැබී සති 03ක් ඇතුළත සම්පූර්ණ වටිනාකම මොණරාගල මහාධිකරණයට මුදලින් ගෙවා වාහනය ඉවත් කර ගත යුතු ය.

07. ටෙන්ඩර් භාර ගැනීම, විවෘත කිරීම, ප්‍රතික්ෂේප කිරීම, අවලංගු කිරීම පිළිබඳ බලතල ටෙන්ඩර් මණ්ඩලය සතුවන අතර, මේ සම්බන්ධ වැඩිදුර විස්තර අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 055-2277101 ඔස්සේ මොණරාගල මහාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙතින් ලබා ගත හැකි ය.

අනු. අංකය	*නඩු අංකය*	*වාහන ලියාපදිංචි අංකය*	*වර්ගය/ මාදිලිය*	*ඇප තැන්පතු රුපියල්*	*වාහන පරීක්ෂා කළ හැකි ස්ථානය*
01.	35/10 (අප)	SP KA 4545	මැස්ඩා කාර් රථය	5,000 0	මහාධි/මොණරාගල
02.	BR-05/06	24 ශ්‍රී 4979	ලොරි රථය	5,000 0	දිසා/මහේ/අධි/ මොණ
03.	43715	26 ශ්‍රී 4450	ලොරි රථය	5,000 0	දිසා/මහේ/අධි/මොණ
04.	38964	68-2493	ලොරි රථය	5,000 0	දිසා/මහේ/අධි/වැල්ලවා
05.	57230	UP GV - 4245	ත්‍රිවිල් රථය	5,000 0	දිසා/මහේ/අධි/වැල්ලවා.

කේ. එම්. ගිහාන් එච්. කුලතුංග,
මහාධිකරණ විනිසුරු,
ඌව පළාත්බද මහාධිකරණය,
මොණරාගල.

2013 මාර්තු මස 27 වැනි දින,
මොණරාගල ඌව පළාත්බද මහාධිකරණයේ දී ය.
04-475

මහාධිකරණය - කළුතර

කළුතර මහාධිකරණ කලාපීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මෙහි පහත උපලේඛනයේ දැක්වෙන කළුතර මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරන ලද මෝටර් වාහනය ටෙන්ඩර් මගින් විකිණීම සඳහා 2013.04.30 වැනි දින පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර් අයදුම්පත් භාර ගනු ලැබේ.

02. ආපසු නොගෙවෙන රු. 100 ක ටෙන්ඩර් ගාස්තුවක් ගෙවා නියමිත අකෘති පත් හා විස්තර කළුතර මහාධිකරණ ගිණුම් අංශයෙන් ලබාගත යුතු ය.

03. ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතුවක් ද අධිකරණයේ තැන්පත් කළ යුතු අතර අදාළ මුදල උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් පතුයේ පිටපත් දෙක සමග මුදල් ගෙවන ලද කුවිතාන්සි ඡායා පිටපත් ද අමුණා එවිය යුතු අතර ටෙන්ඩර්පත් ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ "වාහන සඳහා මිල ගණන් 2013" යනුවෙන් සඳහන් කර කළුතර මහාධිකරණයේ ගණකාධිකාරී වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අතින් ගෙනවිත් භාරදෙනු ලබන ටෙන්ඩර්පත් ගණකාධිකාරී ඉදිරියේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකි ය.

04. වාහන පරීක්ෂා කිරීම සඳහා 2013.04.29 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල දී රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව අනුමැතිය ඇතිව කාර්යාල වේලාව තුළ දී පරීක්ෂා කළ හැකි ය. වාහනය කළුතර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී පරීක්ෂා කළ හැකිය.

05. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර්කරුවන්ට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකි අතර, 2013.04.30 වැනි දින ප. ව. 1.30 ට කළුතර මහාධිකරණයේ දී කලාපීය ප්‍රසම්පාදන කමිටුව මගින් ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ.

06. ලියාපදිංචි තැපෑලෙන් දැනුම්දීම ලැබී සති 03ක් ඇතුළත සම්පූර්ණ වටිනාකම මුදලින් ගෙවා වාහන ඉවත් කර ගත යුතු ය.

07. ටෙන්ඩර් භාර ගැනීම, විවෘත කිරීම, ප්‍රතික්ෂේප කිරීම, අවලංගු කිරීම පිළිබඳ බලතල ටෙන්ඩර් මණ්ඩලය සතුවන අතර, මේ සම්බන්ධ වැඩිදුර විස්තර අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 034-2222486 ඔස්සේ කළුතර මහාධිකරණයේ ගණකාධිකාරී වෙතින් ලබා ගත හැකි ය.

උපලේඛනය

නඩු අංකය	*වාහන ලියාපදිංචි අංකය*	*වර්ගය/ මාදිලිය*	*ඇප තැන්පතුව රුපියල්*	*වාහනය පරීක්ෂා කළ හැකි ස්ථානය*
98904	43-3398	ලොරි රථය	5000 0	කළුතර මහෙස්ත්‍රාත් අධිකරණය

එච්. එම්. ඒ. තිලකරත්න,
බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ පහළ බියන්විල පිහිටි දළුක්ගහලන්ද නොහොත් අඹගහවත්ත නැමති ඉඩමට අංක 3836 දරන පිඹුරේ සඳහන් කැබලි අංක B හි අනු බෙදීමක් වන) අංක 591 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 02 දරන ඉඩම් කොටස. අංක 1097 දරන බැඳුම්කරය යටතේ අයවිය විය යුතු මුදල් ගෙවීම පැලියගොඩ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි ස්ථිරක් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පැහැර හැර ඇති හෙයින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත වර්ෂ 2013 ක් වූ මැයි මස 10 වැනි දින පෙ.ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2013.03.28 වන දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* ද 2013.03.13 වැනි දින "ද අයිලන්ඩ්" "දිවයින" යන පුවත්පත් සහ 2013.03.13 වැනි දින "තිනකුරල්" යන පුවත් පත් බලන්න.

දේපළට ප්‍රවිශ්ඨ වන මාර්ගය.- කිරිබත්ගොඩ නගර මධ්‍යයේ සිට නුවර දෙසට කි. මී. 1.7 ක් පමණ ගමන් කර දකුණට හැරී මීටර් 100 ක් පමණ බංගලාවත්ත පාරේ ගමන්කර දකුණට හැරී මීටර් 75 ක් පමණ ගමන් කර නැවතත් දකුණට හැරී කොටසක් තාර දමා ඇති 1 වන පටුමගට හැරී නැවතත් වමට හැරී අඩි 12 ක් පළලැති පුද්ගලික පාරේ බෑවුමෙන් පහළට බැසීමෙන් පසුව පාරේ වමට පිහිටා ඇති මෙම දේපළ හමුවේ.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැනුම් මිලෙන් 10% ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් ද සහ වැට බද්ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් ද, (4) සියලුම ප්‍රවාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500 ක් ද, (6) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 3,000 ක් ද වේ. ගැණුම් මිලේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02 නවම් මාවතේ අංක 40 දරන ස්ථානයේ පිහිටි නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි නීති කළමනාකරු අයකිරීම් ගෙන් විමසන්න. අංක 2448448, 0117448448.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බෞද්ධගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 2873656, 0777-6720982
ෆැක්ස් අංකය : 2871184.
04-511

නැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මොරටුමුල්ල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පදිංචියට සුදුසු වටිනා දේපලක් :- බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, මොරටුව මහ නගර සභා සීමාවේ, රාවතාවත්ත හි පිහිටි 3 වන පටුමග, වරිපනම් අංක 19 සහ 1/9 දරන "ගනේවත්ත" නමැති ඉඩමට බලයලත් මානක සුනිල් ජේ. පීරිස් විසින් මැන සාදන ලද අංක. 5137 දරන සහ 2000.10.03 වැනි දින දරන පිඹුරේ ප්‍රකාර ලොට් "1" හි ප්‍රමාණයෙන් අක්කර බින්දුවයි රූඩ් බින්දුවයි පර්චස් දාහතරයි දශම අටයි බින්දුවක් (අ. 0, රූ. 0, පර්. 14.80) විශාල ඉඩම සහ එයට අයත් සියළුම දේ ද වේ.

මෙම දේපල.- මහමෙදිගේ කමල්සිරි මෙන්ඩිස් ණයකරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් මොරටුව ප්‍රසිද්ධ නොතාරිස් එන්. ජේ. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද්දා වූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දා වූ ද, 2000.12.06 වැනි දින අංක. 4609 දරන බැඳුම්කරය යටතේ ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

දේපලට පිවිසීම.- මෙම දේපලට පිවිසීමට හැකි වන්නේ, මොරටුව රාවතාවත්ත හන්දියේ සිට වම් පැත්තේ ඇති ජනතා ජය මාවතේ සැතපුම් කාලක් (1/4) ක් පමණ දුරක් යාමෙන් පසුවයි. මෙම මාවත දිගේ තවත් යාර 500 ක් පමණ දුරක් ගිය විට මෙම දේපල වම් පැත්තේ වරිපනම් අංක 19 ජනතා ජය මාවත නැමති ස්ථානයේ පාරට මායිම්ව පිහිටා ඇත.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2013 ක් වූ මැයි මස 14 වැනි දින පෙ.ව. 11.30 ට දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා.- *රජයේ ගැසට් පත්‍රයේ* වර්ෂ 2010 ක් වූ මැයි මස 07 වැනි දින ද, ද අයිලන්ඩ් නිතකරන් පුවත්පත්වල වර්ෂ 2010 ක් වූ මැයි මස 13 වැනි දින පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

ගෙවීමේ ක්‍රමය.- විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්) ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 1% (සියයට එකක්) ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්) ද,
4. ලිපිකරු සහ සෝෂක චේතනය රු. 500 ක් සහ සියළුම ප්‍රචාරක වියදම් ද,
5. නොතාරිස් ගාස්තු සහ විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 ක් ද,

ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්), විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත දී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවා නිම කළ යුතු වේ. එසේ ඉතිරි 90% ක මුදල දින 30 ක් ඇතුලත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ එකී දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත. හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර සඳහා විමසන්න ප්‍රධාන කළමනාකරු (අය කිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී. අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10. දුරකථන 011-2661821, 011-2661835.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ තක්සේරුකරු
සාම විනිසුරු, (මුළු දිවයිනටම).

කාර්යාලය : අංක 25 බී බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක : 011-5756356, 011-2334808
04-607

කඩුවෙල දිසා අධිකරණයේදීය

සණස ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් සීමාසහිත සණස සංවර්ධන බැංකුව යන නාමයෙන්ද හැඳින්වෙන නව ලිපිනය අංක 12 එඩ්මන්ටන් පාර, කිරුලපන කොළඹ 06.

.....*පැමිණිලිකරු.*
එදිරිව

සණස ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්,අංක 340 2/1, ආර්. ඒ. ද මෙල් මාවත කිරුලපන, කොළඹ 06

පටිපාටිය :

1. හිඟුරලගේ ලලිත් කුමාර
2. හිඟුරලගේ හෙන්රී ප්‍රනාන්දු
3. නුවරසක්ෂ පේඩිගේ ප්‍රේමාවතී
4. මානික්කුඩාදුර මංගයා (සියළු දෙනාම)

නඩු අංකය : 211/එම්
ස්වභාවය : උකස් නිශ්චල වටිනාකම :
රු. 1,090,931.36
සාමාන්‍ය

අංක 17 මැල්පුර ගොතටුව නව නගරය, අංගොඩ.

.....*විත්තිකරුවන්.*

ඉහත අංක දරන නඩුවේ 2010.11.22 වැනි දින ප්‍රකාශයට පත් කරන ලද නීන්දු ප්‍රකාශය අනුව ඉහත අංක දරන නඩුවේ විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට ගෙවිය යුතුයැයි නීන්දු කරන ලද රු. 669, 596.44 සහ රු 476,719.20 ක් හා ඒ මත වර්ෂ 2009.04.07 දින සිට වර්ෂයකට 24% බැගින් වූ පොලිය සහ රු. 421,334.92 මුදලක් හා රු. 296,919.18 මුදලට වර්ෂ 2009.04.07 දින සිට වර්ෂයකට 26% බැගින් වූ පොලිය ගෙවීම පැහැර හැරීම හේතුවෙන් වර්ෂ 2013.06.18 දාතමින් මා වෙත නිකුත් කරනු ලැබූ අධිකාරී බලපත්‍රය මත මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් දේපල වර්ෂ 2013 ක් වූ මැයි මස 15 වැනි දින ප.ව. 1.00 ට අංගොඩ, ගොතටුව නව නගරය මැල්පුර වරිපනම් අංක 17 දරන දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අත්තිකුරු කෝරළේ පල්ලේ අඹතලෙන් පහල කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ කොටිකාවත්තෙහි පිහිටි අයි. ඩී. එච්. පරිශ්‍රය නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. කස්තුරිආරච්චි මහතා විසින් මැන සාදන ලද අංක 4146 ඒ සහ වර්ෂ 2006 ක් වූ සැප්තැම්බර් මස 27 දිනැති පිඹුරේ කැබලි අංක 18 ඒ සඳහා මායිම්, උතුරට : පී පිඹුරු අංක 6387 හි කැබලි අංක 17 සහ මාර්ගය, නැඟෙනහිරට : මාර්ගය සහ පී පිඹුරු අංක සී 6387 කැබලි අංක 19, දකුණට : පී. පිඹුරු අංක සී 6387 හි කැබලි අංක 19 සහ පිඹුරු අංක සී 6387 හි ඉතිරි කොටස වන කැබලි අංක 18, බස්නාහිරට : පී. පී. සී 6387 හි ඉතිරි කොටස වන කැබලි අංක 18 සහ පිඹුරු අංක 6387 හි කැබලි අංක 17 ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් නවයයි දශම හයක් (අ.0, රූ. 0, පර්. 9.6) විශාල ඉඩම සහ එහි පිහිටි සියළු ගහකොළ පළතුරු ගොඩනැගිලි යන සියළුම දේද සමග වේ.

දේපලට පිවිසීම.- ගොතටුව නව නගරයේ සිට කොටිකාවත්ත හන්දිය දෙසට කි. මී. 1 1/2 ක් පමණ ගමන් කිරීමේ දී දකුණු පැත්තට ඇති මල්පුර පාරට හැරී මද දුරක් ගොස් නැවත දකුණට හැරී ගමන් කිරීමේ දී හමුවන බුදුගෙය අසලින් දකුණට මීටර් 300 පමණ ගමන් කිරීමේ දී දකුණු පැත්තේ මෙම දේපල පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය.- වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

විකුණුම් මිලෙන් 25% (සියයට විසිපහක්), ප්‍රාදේශීය සභා ගාස්තු 1% (සියයට එකක්), සියලුම ප්‍රචාරක ගාස්තු, වෙන්දේසිකරුගේ වෘත්තීය ගාස්තු (ගැනුම් මිලෙන් 2 1/2%), මුද්දර ගාස්තු, නොතාරිස් ගාස්තු, ලිපිකරු හා සෝෂක ගාස්තු, පළාත් පාලන ආයතනයන් විසින් පනවනු ලැබූ වෙනත් බදු ආදිය ඉතිරි සියයට හැත්තෑ පහක (75%) ක මුදල දින 30 ක් ඇතුලත ඉහත අංක දරන නඩුවේ බැරට තැන්පත් කල යුතු අතර එසේ ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත් මුලින් තැන්පත් කරන ලද මුදල් ආපසු නොගෙවන අතර එකී දේපල නැවත වෙන්දේසියේ තැබීමට ක්‍රියා කරනු ඇත. අදාල ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂාව හා වැඩි විස්තර සඳහා කළමණාකරු (නීත අයකිරීම් අංශය) සණස සංවර්ධන බැංකුව කඩුවෙල පාර බත්තරමුල්ල හා දුරකථන අංක 2866994, 071-4175944 විමසීමෙන් ලබාගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු හා තක්සේරුකරු.

04-601

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - දෙල්ගොඩ ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)
1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ(විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. එන්. රාජකරුණා විසින් සහතික කරන ලද්දා වූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දා වූ ද 2007.07.20 දිනැති සහ අංක 25133 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මල්මාල ආරච්චිගේ ප්‍රේමසිරි යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල 2013 ක් වූ මැයි මස 17 වැනි දින පෙ.ව. 9.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපල.- බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ අධිකාරී පත්තුවේ බියගම ප්‍රාදේශී සභා සීමාව තුළ ගෝනවල ගමේ පිහිටි කැකුණගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක කේ. ඒ. රූපසිංහ විසින් මැන සාදන ලද 2005.09.18 දිනැති අංක 995/2006 දරන පිඹුර ප්‍රකාර ලොට් බී 1 ලෙස සළකුණු කළ ඉඩම සහ එහි ඇති ගොඩනැගිලි ගහකොළ වැවිලි සහ අනෙකුත් සියළු දේත්. විශාලත්වය පර්චස් හතක් (අ. 0, රූ. 0, පර්. 7)

ලොට් සී 1 ට අයත් අංක 995/2006 දරන පිඹුරේ වැඩිදුරටත් විස්තර වන මාර්ග අයිතිය ද සමග වේ.

ඉහත විස්තර කරන ලද ලොට් බී 1 දරන ඉඩම පහත දැක්වෙන ඉඩමේ නැවත මැනීමකි. ඉහත කී ගෝනවල ගමෙහි පිහිටි කැකුණගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක කේ. ඒ. රූපසිංහ විසින් මැන සාදන ලද 1996.09.18 දිනැති අංක 663/1995 දරන පිඹුර ප්‍රකාර ලොට් බී ලෙස සළකුණු කළ ඉඩම සහ එහි ඇති ගොඩනැගිලි ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියලු දේත්. විශාලත්වය පර්චස් හතක් (අ. 0, රූ. 0, පර්. 7)

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2013.03.01 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2013.03.07 දින ලක්බිම ඩේලි මිරර් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

ඉඩමට පිවිසීම. -දෙල්ගොඩ නගර මධ්‍යයේ සිට නව නුවර පාරේ කැලණිය දෙසට කි. මී 13 ක් පමණ නාගහමුල්ල හන්දිය දක්වා ගමන් කරන්න. එතැනින් ගෝනවල පාරේ දකුණට හැරී කි. මී. 1.90 ක් පමණ දුරක් විලඟේන පාරේ ඉදිරියට යන්න. එතැනින් වමට හැරී, ඉහත කී තාර පාරේ මීටර් 300 ක් පමණ අඩි 8 ක් පළල කෙළවරේ අවසනක් ඇති ගුරුපාර දක්වා ගමන් කරන්න. අවසන් වශයෙන් ඉහත කී අඩි 8 ක් පළල ගුරු පාරට දකුණට හැරී, මීටර් 20 ක් ඉදිරියට ගියවිට එහි කෙළවරේ ඇති ප්‍රශ්චිත දේපලට ළඟා විය හැකිය.

ගෙවීමේ ක්‍රමය.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය:-

1. ගැණුම් මිලෙන් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක්ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු. 500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැනුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු සහ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු : (ණය අධීක්ෂණ හා අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අංක 479, ටී. බී. ජායා මාවත කොළඹ 10. (දුරකථන අංකය 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම් සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

අංක 156- 1/13,
උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0112-337707,
0777-378441 ,
0714-424478.
ෆැක්ස් අංකය : 0112-337707.
04-593

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - ජාඇල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඉතා වටිනා දෙමහල් නිවාස ගොඩනැගිල්ලක් ශ්‍රී ජයවර්ධනපුර මහනගර සභා සීමාවන් තුළ ඇතුල්කෝට්ටේ ගමේ ඊ. ඩබ්ලිව්. පෙරේරා මාවතේ පිහිටි මීගහකොරටුව වත්ත නමැති ඉඩමට බලයලත් මානක පී. එෆ්. ඩයස් විසින් 1994.06.16 වැනි දින සාදන ලද අංක 205 ඒ දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් ඒ 1 නමැති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සියළු දේ. ඉඩමේ ප්‍රමාණය : පර්චස් 16.38 මෙම දේපල අවීන් සිලෙක්ෂන්ස් යන ව්‍යාපාර නාමය විලාශය සහ අභිධානය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන එරන්ද ඉෂාන් විජේසිංහ, බාලසූරිය අප්පුහාමිලාගේ මේරි සුජීවා පෙරේරා සහ ඉන්ද්‍රා හේමමාලි විජේසිංහ යන අය බන්ධනදායී වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

දේපලට පිවිසීම.- බොරැල්ල කෝට්ටේ මාර්ගයේ ඇතුල් කෝට්ටේ මහජන බැංකු පරිශ්‍රය ලඟින් පිහිටි අඩි 15 ක් පළල පාරට ඇතුළු වී මීටර් 80 ක පමණ ගිය පසු අදාළ දේපල මෙම පාරේ අවසානයේ පිහිටා තිබේ.

2013 ක් වූ මැයි මස 17 වැනි දින ප.ව. 1.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2012.09.07 දින *රජයේ ගැසට් පත්‍රයද* 2012.10.09 දින ඩේලිමිරර්, ලක්බිම හා තිනකරන් පුවත්පත් බලන්න.

ගෙවීමේ ක්‍රමය.- මිළ තීන්දු වූ වාහම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරී (අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661835, 011-2661836, 011-2661826
අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර,
මාවිල්මඩ,
මහනුවර.
දුරකථන අංක :081-2210595/071-4755974/071-8446374/077-7761706
04-634

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2013 අංක 146

MOD/DEF/10/03/RET/38.

ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2012 සැප්තැම්බර් මස 21 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත :

එයාර් වයිස් මාර්ෂල් - අමෝකා මද්දුම බණ්ඩාර අමුනුගම (01256) - දන්ත වෛද්‍ය

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිපී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 ජූලි මස 24 වැනි දින,
කොළඹ දී ය.
04-481

2013 අංක 147

ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2013 ජනවාරි මස 01 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත :

එයාර් කොමඩෝර් - අජිත් ප්‍රේමලාල් අබේසේකර (01378) - ගු.තො.නි

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිපී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 ඔක්තෝබර් මස 08 වැනි දින,
කොළඹ දී ය.
04-482

2013 අංක 148

MOD/DEF/10/03.

ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2012 සැප්තැම්බර් මස 05 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත.

ග෴ප් කැප්ටන් - පුස්සේවල හේවාගේ මංගලආරි (01461) - කාර්මික ඉංජිනේරු ශාඛාව

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශය.

2012 ජූනි මස 14 වැනි දින,
කොළඹ දී ය.
04-480

2013 අංක 149

MOD/DEF/10/03/E05/03.

ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද සේවා කාලය දිර්ඝ කිරීමක්

පහත නම සඳහන් නිලධාරියාගේ ස්ථිර විංග් කමාන්ඩර් නිලයේ සේවා කාලය 2013 ජූනි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි වසරක් දීර්ඝ කෙරේ.

තාවකාලික ග෴ප් කැප්ටන් රන්වගොඩ ගමගේ චන්දන දීප්ති රවිහන්ස (01580) පරිපාලන රෙජිමේන්තු

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශය.

2013 පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.
04-483

2013 අංක 150

MOD/DEF/10/03/RET/36.

ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2012 ජූලි මස 31 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත.

විං කමාන්ඩර් - අනුරුද් ප්‍රභාෂ් ගුරුගමගේ (01748) - කාර්මික ඉංජිනේරු

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී. පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශය.

2012 ජූනි මස 06 වැනි දින,
කොළඹ දී ය.
04-562

අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2013 අංක 151

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I පන්තියේ කේ. පී. ආරියදාස මහතා, 2012 සැප්තැම්බර් මස 27 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වන සංරක්ෂක ජනරාල් වශයෙන්.

04-566

රජයේ නිවේදන

ජාතික පරිසර පනතේ 23 බී. බී. (4) ඡේදය යටතේ කෙරෙන නිවේදනය

පුත්තලම සිට අනුරාධපුර දක්වා වූ කි. වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය

ඉහත සඳහන් ව්‍යාපෘතියට අදාල මූලික පාරිසරික ඇගයුම් වර්තාව අධ්‍යයනය කිරීමෙන්, පසුව නිශ්චිත නියමයන් සහ කොන්දේසිවලට යටත්ව 2000.11.22 දින අංක 1159/22 දරන අති විශෙෂ ගැසට් නිවේදනය මගින් සංශෝධිත, 1993 ජාතික පාරිසරික රෙගුලාසි 01 හි 13 (1) රෙගුලාසිය (ව්‍යාපෘති අනුමැතිය සඳහා වූ කාර්යය පටිපාටිය) ප්‍රකාර, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය දී ඇති බව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම්. එම්. සී. ප්‍රනාන්දු,
ලේකම්,
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය,

අංක 72, ආනන්ද කුමාරස්වාමි මාවත,
කොළඹ 07.
2013 මාර්තු මස 27 වැනි දින.
04-507

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ සිදු කිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර නමැති, ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම, ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල මීට පෙර එකී 1974 සැප්තැම්බර් මස 13 වැනි දින හා අංක 1030 දරන සහතිකය යටතේ යම් ජනකායක් වෙනුවෙන් ලියාපදිංචි කරන ලද මුත්, එම ජනකායගේ දේවස්ථානයක් ලෙස දැනට ප්‍රයෝජනයට නොගනු ලබන්නාවූ ද, ගොඩනැගිල්ල වෙනුවට විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අංකය	*ලියාපදිංචි කිරීමේ දිනය*	*විස්තරය*	*පිහිටීම*	*දේවගැතිතැන, අයිතිකරු හෝ, භාරකරු*	*ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද*
1434	2013.03.03	ඇපොස්තලික දේවස්ථානය	අංක 50/11, ජුබිලි මාවත, මට්ටක්කුලිය කොළඹ 15	ගරු වර්ණකුලසූරිය වීරකොණ්ඩ ආරච්චිගේ බැසිල් කැනීෂියස් ප්‍රනාන්දු	ඇපොස්තලික දේව සභාව

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල,
2013 මාර්තු මස 27 වැනි දින.
10 -563

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ සිදු කිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර නමැති, ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම, ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අංකය	*ලියාපදිංචි කිරීමේ දිනය*	*විස්තරය*	*පිහිටීම*	*දේවගැතිතැන, අයිතිකරු හෝ, භාරකරු*	*ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද*
1435	2013.03.12	සිරිකුරුස දේවස්ථානය	සිරිවර්ධන පෙදෙස, මුන්නක්කරය මීගමුව	ගරු උදයදාස් අරුලානන්දම් පියතුමා	ලංකා පෙන්තකොස්ත සභාව

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල,
2013 මාර්තු මස 27 වැනි දින.
10 -565

වන්නිවලාංකුලම් ශ්‍රී මුතුමාරිඅම්මන් පොංකල් උත්සවය - 2013

මුලතිව් දිස්ත්‍රික්කය

ඉහත සඳහන් පොංකල් උත්සවය 2013 මැයි මස 24 වැනි දින පෙරවරු 6.00 ට පටන්ගෙන 2013 මැයි මස 25 වැනි දින පෙරවරු 10.00 ට අවසන් වන බව පොදු මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මේ පිළිබඳව 1949 මැයි මස 27 වැනි දින අංක 9978 හා 1950 මැයි මස 26 වැනි දිනැති අංක 10105 දරන රෙගුලාසිවලට පොදු ජනතාවගේ අවධානය යොමු කරවනු ලැබේ.

03. ප්‍රසිද්ධියට පත් කරන ලද මෙම නිත්‍ය රෙගුලාසි මෙම උත්සවය පැවැත්වෙන කාල සීමාව තුළ වලංගුවනවා ඇත.

එන්. වේදනායහන්,
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
මුලතිව් දිස්ත්‍රික්කය.

2013 මාර්තු මස....... වැනි දින.
04-643

උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනත

5 වැනි වගන්තිය යටතේ නිවේදනය

(110 වැනි අධිකාරය වූ) උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 5 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න වන මම, 2012 ජූලි මස 08 වැනි දින අංක 1762 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ රජයේ නිවේදන යටතේ වූ නිවේදනයෙහි,

කොළඹ දිස්ත්‍රික්කයේ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැස්බෑව උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත් "අ" උපලේඛනයෙහි සඳහන් ගම් ලැයිස්තුව සංශෝධනය කිරීමෙන් ද,

මාම්පේ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත් "ආ" උපලේඛනයෙහි සඳහන් ගම් ලැයිස්තුව සංශෝධනය කිරීමෙන් ද,

තුම්බෝවිල උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත් "ඇ" උපලේඛනයෙහි සඳහන් ගම් ලැයිස්තුව ප්‍රතිපූරණය කිරීමෙන් ද,

2013 මැයි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කරමි.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍ය.

2013 පෙබරවාරි මස 14 වැනි දින,
කොළඹ දී ය.

"අ" උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කය

කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැස්බෑව උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස ගම් ලැයිස්තුව

1. දම්පේ
2. මඩපාත
3. කහපොළ
4. රෙජිඩේල් වත්ත
5. පොල්හේන
6. මාකන්දන බටහිර
7. මාකන්දන නැගෙනහිර
8. ජබුරලිය
9. බටුවන්දර දකුණ
10. බටුවන්දර උතුර
11. මොරැද
12. නිවුන්ගම
13. හල්පිට
14. හොරතුඩුව/කෝදුරාව
15. කැස්බෑව දකුණ
16. කැස්බෑව උතුර
17. කැස්බෑව නැගෙනහිර

"ආ" උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කය

කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාම්පේ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස ගම් ලැයිස්තුව

1. නීලම්මහර
2. නිවන්තිඩිය
3. කාලියම්මහර
4. පලිගෙදර
5. ඇරැව්වල බටහිර
6. ඇරැව්වල උතුර
7. ඇරැව්වල නැගෙනහිර
8. රත්මල්දෙනිය
9. මහල්වරාව
10. බංගලාවත්ත
11. පැලැන්වත්ත නැගෙනහිර
12. පැලැන්වත්ත උතුර
13. පැලැන්වත්ත බටහිර
14. ගොරකපිටිය
15. නාම්පමුණුව
16. මකුළුදුව
17. මාම්පේ උතුර
18. මාම්පේ දකුණ
19. මාම්පේ බටහිර
20. මාම්පේ නැගෙනහිර
21. විශ්වකලාව
22. මාවිත්තර උතුර
23. මාවිත්තර දකුණ
24. හොන්නන්තර උතුර
25. හොන්නන්තර දකුණ

"ඇ" උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කය

කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත තුම්බෝවිල උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ගම් ලැයිස්තුව

1. වේරහැර උතුර
2. වේරහැර දකුණ
3. බෝධිරාජපුර
4. කටුවාවල උතුර
5. කටුවාවල දකුණ
6. තුම්බෝවිල උතුර
7. තුම්බෝවිල දකුණ
8. තුම්බෝවිල බටහිර
9. බෝකුන්දර
10.වෑවල නැගෙනහිර
11. වෑවල බටහිර
12. සුවාරපොළ නැගෙනහිර
13. සුවාරපොළ බටහිර
14. කොළමුන්න
15. හැඬිගම
16. බටකැත්තර උතුර
17. බටකැත්තර දකුණ
18. දැල්තර බටහිර
19. දැල්තර නැගෙනහිර

04 564

ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා වලට අදාළ අංක 04- 547 දරන නිවේදනය සඳහා කරුණාකර 2013.04.19 වැනි දින *ගැසට් පත්‍රය* බලන්න

විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2013 ජනවාරි මස 30 වැනි දින දි ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ගුණරත්න විසින් ලියා සහතික කරන ලද අංක 1632 හා 2005 ජූලි 06 වැනි දින ද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එස්. පී. කොඩිතුවක්කු විසින් ලියා සහතික කරන ලද අංක 761 හා 2009 නොවැම්බර් 19 දින දරන උකස් බැඳුම්කර මත, අයවිය යුතු මුදල් ගෙවීම්, 1982 අංක 17 දරන සමාගම් පනත/1938 අංක 51 දරන සමාගම් ආඥාපනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කර තිබෙන, (කලින් ලියාපදිංචි අංකය N(PVS) 11584 වූ) දැනට ලියාපදිංචි අංක PV20473 දරන සහ ලියාපදිංචි කාර්යාලය බත්තරමුල්ල, පැලවත්ත, දේසිංහ මාවත, අංක 603 හි පිහිටා තිබෙන, (මෙහි මින් ඉදිරියට "එකී සමාගම" යනුවෙන් සඳහන් කරන) ලයිෆ් ස්ටයිල් ඉන්ටර්නැෂනල් ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2012 නොවැම්බර් 30 වැනි දිනට ඉහත කී ලයිෆ් ස්ටයිල් ඉන්ටර්නැෂනල් ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හැත්තෑපන් ලක්ෂ අනූඑක් දහස් පන්සිය හතලිස් අටකුත් ශත විසි නවයක (රු.75,91,548.29) මුදලක් සහ 2012 දෙසැම්බර් 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තිස්තුන් ලක්ෂ පන්දහස් පන්සිය එකක් (රු.33,05,501) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝම්බර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරන ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක්, මත ගණන් බලනු ලබන වාර්ෂික අනුපාතිකය මත පොළියද, රුපියල් තිස්අට ලක්ෂ තිස්තුන්දහස් තුන්සිය තිස්දෙකක (රු.38,33,332) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන මෙහි පහත දැක්වෙන පාදක පොලී අනුපාතික අතරින් එනම් :

(අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය හෝ

(ආ) රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකයට ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේදී බලාත්මකව පැවති වඩා ඉහළ අනුපාතිකයට වර්ෂයකට සියයට අටක (8%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන ඉහත කී රුපියල් හැත්තෑපන් ලක්ෂ අනූඑක් දහස් පන්සිය හතලිස් අටකුත් ශත විසි නවයක (රු.75,91,548.29) මුදලක් සහ 2012 දෙසැම්බර් 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තිස්තුන් ලක්ෂ පන්දහස් පන්සිය එකක් (රු.33,05,501) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝම්බර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන වාර්ෂික අනුපාතිකය මත පොළියද, රුපියල් තිස් අට ලක්ෂ තිස්තුන්දහස් තුන්සිය තිස්දෙකක (රු.38,33,332) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන මෙහි පහත දැක්වෙන පාදක පොලී අනුපාතික අතරින් එනම්,

(අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය හෝ

(ආ) රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකයට ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේදී බලාත්මක පැවති වඩා ඉහල අනුපාතිකයට වර්ෂයකට සියයට අටක (8%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාල ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර එකී අංක 1632 හා 761 දරන උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තුද සමග අයකර

ගැනීම සඳහා ඉහත කී අංක 1632 හා 761 දරන උකස් බැඳුම්කර මඟින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩමට හා පරිශ්‍රයට පවත්නා නිදහස්ව දැරීමේ අයිතිවාසිකම් (Free Hold Rights) සහ එහි පිහිටි සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

අංක 1632 සහ 761 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපල විස්තරය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඳුකර පහල කෝරළේ මෙගොඩ කළුගමුව ග්‍රාමයේ පිහිටි "ගල්ඔය එස්ටේට්" නමැති ඉඩමේ බලයලත් මානක ආර්. බී. විජේකෝන් මැන සකස් කළ අංක 2216 හා 2004 සැප්තැම්බර් මස 13 දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1-33 ලෙස ලකුණු කළ එකට යාවූ බිම් කොටස්වලින් සංයුක්ත ඉඩමට මායිම් උතුරට : ගල්ඔය එස්ටේට් දොළ ටීපී අංක 44825 සහ අප්ලන්ඩ් එස්ටේට් වත්තේ සිට එන පාර ද, (Stream) නැගෙනහිරට: සර්වේයර් ජනරාල්වරයා සකස් කළ අංක මහ 1339 දරන ගල්ඔය එස්ටේට් මූලික පිඹුර (P-Plan) ද, දකුණට : පාර මහනුවර-ගලහ පාර, හල්ඔය ද, බස්නාහිරට : අංක මහ 1339 දරන මූලික පිඹුරේ (P-Plan) ගල්ඔය එස්ටේට් වත්ත, අංක මහ 1339 දරන මූලික පිඹුරේ ගල්ඔය එස්ටේට් ලොට් අංක 4 සහ හල්ඔය සිට එන පාර ද යන මායිම් ඇතුලත අක්කර විසිනවයකුත් පර්චස් දහහතරයි දශම දෙකයි හයක් (අ. 29, රූ. 0, පර්. 14.26) නොහොත් හෙක්ටයාර 11.7721 ක් බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගසකොළ, වැවිලි හා වෙනත් සියලු දේ.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
73/5, ගාලු පාර,
කොළඹ 03.
04-603

ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2013 ජනවාරි 30 වන දිනදී ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව නමින් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ගුණරත්න විසින් ලියා සහතික කරන ලද අංක 1862 හා 2006 දෙසැම්බර් මස 07 දින දරන උකස් බැඳුම්කරය මත, අයවිය යුතු මුදල් ගෙවීම්, මීගමුව, සෙල්බි පාර, අංක 3/67 හි වැලිවේරියගේ ආනක්ලීටස් රෙමීජියස් මිල්ටන් පෙරේරා යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2012 ඔක්තෝබර් මස 31 වන දිනට ඉහත කී වැලිවේරියගේ ආනක්ලීටස් රෙමීජියස් මිල්ටන් පෙරේරා යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් දහහත් ලක්ෂ තිස්එක් දහස් හාරසිය හැත්තෑ හයකුත් ශත විසිහතරක (රු.17,31,476.24) මුදලක් සහ 2012 නොවැම්බර් 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දහතුන් ලක්ෂ තිස් දහස් හාරසිය හතළිස් එකකුත් ශත හැත්තෑ හතක (රු.13,30,441.77) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝම්බර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල රුපියල් දහහත් ලක්ෂ තිස්එක් දහස් හාරසිය හැත්තෑ හයකුත් ශත විසිහතරක (රු.17,31,476.24) මුදලක් සහ 2012 නොවැම්බර් 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දහතුන්ලක්ෂ තිස් දහස් හාරසිය හතළිස් එකකුත් ශත හැත්තෑ හතක (රු. 13,30,441.77) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය ද හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා ගොඩනැගිලි හා එහි පිහිටි සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර එකී අංක 1862 දරන උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1862 දරන උකස් බැඳුම්කරය මගින් එකී වැලිවේරියගේ ආනක්ලීටස් රෙමීජියස් මිල්ටන් පෙරේරා විසින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි හා වෙනත් සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

අංක 1862 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපල විස්තරය

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ මීගමුව මහනගර සභා සීමාව ඇතුළත කුට්ටිදූවේ පිහිටි කුට්ටිදූවවත්ත නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු ඩී. ප්‍රසාද් විමලසේන විසින් මැන සකස් කරන ලද අංක 1927 හා 1995 ඔක්තෝබර් 30 දින දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දැක්වෙන බිම් කොටස වන උතුරට : රාජා පෙරේරාට අයිති ඉඩම ද, නැගෙනහිරට : වින්සන්ට් ප්‍රනාන්දුට අයිති ඉඩම ද දකුණට : (අඩි හයක් (6) පලළ ප්‍රවේශ මාර්ගය වන) ලොට් අංක 2 සහ ලොට් අංක 3 ද, බස්නාහිරට : ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ ඉඩම, සී ස්ට්‍රීට් පාර සහ ඩබ්ලිව් ඇන්ටනී පෙරේරාට සහ සැම්සන් ප්‍රනාන්දුට අයිති ඉඩම ද යන මායිම් ඇතුළත පර්චස් දොළහකුත් දශම හතරයි බිංදුවක් (අ.0, රූ. 0, පර්. 12.40) බිම් ප්‍රමාණයෙන් නොහොත් හෙක්ටයාර 0.03136 ක් බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි වැවිලි සහ වෙනත් සියළු දේ.

මෙයට මෙහි පහත විස්තර කර තිබෙන පාරක් සඳහා වෙන්කළ බිම් කට්ටියෙන්, එය මතින් සහ ඔස්සේ උකස්කරුට ඔහුගේ අමුත්තන්ට, ඉංජිනේරුවන්ට, කොන්ත්‍රාත්කරුවන්ට, ගෘහනිර්මාණ ශිල්පීන්ට, කම්කරුවන්ට, සේවකයින්ට, කුලී නිවැසියන්ට, අවසරලාභීන්ට සහ ආරාධිතයින්ට මින් මතු සෑම කල්හිම, සදාකාලයට ඔවුන්ගේ අභිමතය හා කැමැත්ත පරිදි කවර වූ හෝ සියලු කාර්ය සඳහා දිවා හෝ රාත්‍රී කාලයේදී පයින් හෝ අන්‍යාකාරයකින් යාම ඊමේ සහ අශ්වයින් ගවයින් හෝ වෙනත් සතුන් ඇතිව හෝ නොමැතිව මෝටර් රථ, මෝටර් ලොරි සහ සෑම වර්ගයකම වෙනත් වාහනවලින් බර පටවා හෝ නොපටවා මෙහි පහත විශේෂයෙන් විස්තර කරන මාර්ගය ඔස්සේ ප්‍රවේශ වීමේ, පිටවීමේ, ප්‍රත්‍යාගමනය කිරීමේ පූර්ණ හා බාධා විරහිත නිදහස හා අවසරයද ඒ හා සම්බන්ධ නැතහොත් ඒ සමග දරන්නා වූ හෝ භුක්ති විඳින්නා වූ සියළු හා එක් එක් අයිතිවාසිකම් හා වරප්‍රසාද භුක්ති විඳීමේ අයිතිය සහ විදුලි රැහැන්, මුදුන් කම්බි, ජලාපවහන, ගෑස් සහ ජලනල, වෙනත් උවාරණ එකී බිම උඩින් මතින් සහ ඔස්සේ ස්ථාපනය කිරීමේ අයිතියද ඇතුළත් වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ මීගමුව මහනගර සභා සීමාව ඇතුළත කුට්ටිදූවේ පිහිටි කුට්ටිදූවවත්ත නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු ඩී. ප්‍රසාද් විමලසේන විසින් මැන සකස් කරන ලද අංක 1927 හා 1995 ඔක්තෝම්බර් මස 30 දින දරන පිඹුරේ ලොට් අංක 2 ලෙස දැක්වෙන බිම් කොටස වන උතුරට: ලොට් අංක 01 සහ වින්සන්ට් ප්‍රනාන්දුට අයිති ඉඩම ද, නැගෙනහිරට: වින්සන්ට් ප්‍රනාන්දුට අයිති ඉඩම ද, දකුණට : කලපුව ද, බස්නාහිරට: ලොට් අංක 03 ද යන මායිම් ඇතුළත පර්චස් බිංදුවයි දශම හයයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 0.60) නොහොත් හෙක්ටයාර 0.00152 ක් බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කට්ටිය මතින් මාර්ග අයිතිය ද ඇතුළත් වේ.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ මීගමුව මහනගර සභා සීමාව ඇතුළත කුට්ටිදූවේ පිහිටි කුට්ටිදූවවත්ත නමැති ඉඩම වන බලයලත් මිනින්දෝරු ආර්. අයි. ප්‍රනාන්දු මැන සකස් කළ අංක 271 හා 1978 ඔක්තෝම්බර් 23 දින දරන පිඹුරට අනුව උතුරට : අඩි පාර ද, නැගෙනහිරට : ඒ. ජී. රොබින්සන් සහ තවත් අයට අයිති ඉඩම ද, දකුණට : ඉයුජින් රුද්‍රිගුට අයිති ඉඩම ද, බස්නාහිරට : සී ස්ට්‍රීට් ශාන්ත සෙබස්තියන් දේවස්ථානයට අයිති ඉඩම ද යන මායිම් ඇතුළත පර්චස් පහළොවකුත් දශම පහක් (අ. 0, රූ. 0 පර්. 15.5) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සෙල්බි පාර වරිපනම් අංක 67/3 දරන ගොඩනැගිලි සහ වැවිලි ද වේ.

මෑතකදී සකස් කළ මැනුම් පිඹුරකට අනුව මෙම ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර කර තිබේ :-

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, මීගමුව මහනගර සභා සීමාව ඇතුළත කුට්ටිදූවේ පිහිටි කුට්ටිදූවවත්ත නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු ඩී. ප්‍රසාද් විමලසේන මැන සකස් කළ අංක 6106 හා 2006 නොවැම්බර් 18 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 1 ලකුණු කළ බිම් කට්ටිය වන සෙල්බි පාර වරිපනම් අංක 63/3 දරන බිම් කට්ටියට මායිම්, උතුරට : අඩිපාර සහ අඩි දොළහක් පළල පාර ද, නැගෙනහිරට : ඒ. ජී. රොබින්සන් පිල්ලේ, ටිරෝන් පිල්ලේ සහ ඩෙම්සන් පිල්ලේට අයිති ඉඩම ද, දකුණට : ඩබ්ලිව්. ආර් එම්. පෙරේරාට අයිති (සෙල්බි පාර වරිපනම් අංක 63A දරන දේපළ වන) ඉඩම ද, බස්නාහිරට : (සී ස්ට්‍රීට් ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ දේපළක් වූ) වයි. එම්. ජූඩ් නික්සියන් ප්‍රනාන්දු හිමිකම් කියන ඉඩම ද යන මායිම් ඇතුළත පර්චස් පහළොවයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 15.50) නොහොත් හෙක්ටයාර 0.03920 ක් බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.
04-602

මහජන බැංකුව - කුරුණෑගල ශාඛාව

වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ වන යෝජනාව

වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත වර්ෂ 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.08.05 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් වයි. පී. කේ. තෙන්නකෝන් මහත්මිය විසින් සහතික කරන ලද 2004.12.01 දිනැති අංක 4010 සහ 2006.01.19 දිනැති අංක 4769 දරන උකස්කරයන් ප්‍රකාර ලංසකාර හේරත් මුදියන්සේලාගේ ඉසුරු සම්පත් ධර්මරත්න යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරයන් යටතේ රුපියල් ලක්ෂ පහලොවක (රු.15,00,000) සහ රුපියල් ලක්ෂ දහහතරක (රු.14,00,000) මුදලක් ද දැනට මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2006.04.27 දින සිට සියයට දහනවයයි දශම දෙකයි පහක් (19.25%) බැගින් රුපියල් ලක්ෂ පහලොවක (රු.15,00,000) මුදලක් සහ 2006.04.28 දින සිට වර්ෂයකට සියයට විස්සයි දශම පහ (20.5%) බැගින් රුපියල් ලක්ෂ දහ හතරක (රු. 14,00,000) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය සහ අදාළ මහජන බැංකු පනතේ 29 ඩී (29D) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර, එකී රුපියල් ලක්ෂ පහලොවක (රු. 15,00,000) සහ රුපියල් ලක්ෂ දහ හතරක (රු.14,00,000) මුදල අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතා විසින් එකී අංක 3726, 4010 සහ අංක 4769 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

දේපළ පිළිබඳ විස්තර

01. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ, කුඩාගල්බොඩ කෝරළේ රත්කරව්ව ගමෙහි පිහිටි ගෝනපනේ කුඹුර සහ ඊට යාවූ පිල්ලෑව නමැති ඉඩමට 1997.10.20 දින බලයලත් මිනින්දෝරු එස්. ටී. ගුණසේකර මහතා විසින් මැන සාදන ලද අංක 5852 ඒ දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 01 වශයෙන් දැක්වෙන ඉඩම බලයලත් මිනින්දෝරු එච්. එම්. එස්. හේරත් මහතා විසින් 2004.02.03 දින එකී අංක 5852 ඒ දරන පිඹුර මතම කොටස් 03 කට බෙදා වෙන් කරන ලදුව ඉන් කැබලි අංක 1 ඒ දරන කොටසට, මායිම් උතුරට : අංක 5852 දරන පිඹුරේ දැක්වූ ගෝනපනේ කුඹුර සහ පිල්ලෑව ද, නැගෙනහිරට : අංක 5852 දරන පිඹුරේ දැක්වූ ගෝනපනේ කුඹුර සහ පිල්ලෑව ද, දකුණට : අංක 5852 ඒ දරන පිඹුර නැවත මැන සාදා ඇති කැබලි අංක 1 බී දරන කැබැල්ල ද, බස්නාහිරට : එකී අංක 5852 ඒ දරන පිඹුරේ නැවත මැන සාදා ඇති කැබලි අංක 1සී දරන අඩි 12 ක් පළල පාර ද යන මෙකී මායිම් තුළ වූ අක්කර එකයි, රූඩ් නැත, පර්චස් හතරක් (අ. 01, රූ. 0, පර්. 04) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පලතුරු ගොඩනැගිලි ආදී සෑම සියළු දේද සමග එකී අංක 5852 ඒ දරන පිඹුරේ සඳහන් කැබලි අංක 01 සී අංක 5244 දරන පිඹුරේ කැබලි අංක 02 ඒ සහ අංක 5244 දරන පිඹුරේ කැබලි අංක -01 දරන ප්‍රවේශ මාර්ග පාවිච්චි කිරීමේ හා නඩත්තු කිරීමේ අයිතිය ද සමඟ වේ. (ඒ./1264/267/කුරුණෑගල)

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ කුඩාගල්බොඩ කෝරළේ රත්කරව්ව ගමෙහි පිහිටි ගෝනපනේ කුඹුර සහ ඊට යාවූ පිල්ලෑව නමැති ඉඩම සඳහා 1997.10.20 දින බලයලත් මිනින්දෝරු එස්. ටී. ගුණසේකර මහතා විසින් මැන සාදන ලද අංක 5852 ඒ දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 01 වශයෙන් දැක්වෙන ඉඩම බලයලත් මිනින්දෝරු එච්. එම්. එස්. හේරත් මහතා විසින් 2004.02.03 දින එකී අංක 5852 ඒ දරන පිඹුර මතම කොටස් 03 කට බෙදා වෙන් කරන ලදුව ඉන් කැබලි අංක 1 බී දරන කොටසට, මායිම්, උතුරට : එකී අංක 5852 ඒ දරන පිඹුරේ නැවත මැන සාදා ඇති කැබලි අංක 01 ඒ දරන කැබැල්ල ද, එකී අංක 5852 ඒ දරන පිඹුරේ කැබලි අංක 1 සී දරන ප්‍රවේශ මාර්ගය ද, නැගෙනහිරට : අංක 5852 දරන පිඹුරේ දැක්වූ ගෝනපනේ කුඹුර සහ පිල්ලෑව ද, දකුණට : අංක 5852 ඒ දරන පිඹුරේ දැක්වූ ගෝනපනේ කුඹුරේ පිල්ලෑව ද, කැබැල්ල ද, බස්නාහිරට : එකී අංක 5852 ඒ දරන පිඹුරේ කැබලි අංක 02 ද, යන මෙකී මායිම් තුළ වූ රූඩ් දෙකයි පර්චස් හයක් (අක්කර 0, රූඩ් 02, පර්. 06) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පලතුරු ගොඩනැගිලි ආදී සෑම සියළු දේද සමග එකී අංක 5852 ඒ දරන පිඹුරේ සඳහන් කැබලි අංක 01 සී අංක 5244 දරන පිඹුරේ කැබලි අංක 02 ඒ සහ අංක 5244 දරන පිඹුරේ කැබලි අංක 01 දරන ප්‍රවේශ මාර්ගය පාවිච්චි කිරීමේ හා නඩත්තු කිරීමේ අයිතියත් සමග වේ. (ඒ/1264/268/කුරුණෑගල)

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ තිරගන්දහය කෝරළේ කුරුණෑගල මහ නගර සභා සීමාව තුළ පුත්තලම් පාරේ පිහිටි කඳුබොඩ හේන දැනට වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. සී. එස්. එම්. අබේසේකර මහතා විසින් මැන සාදන ලද අංක 87/94 සහ 1994.05.16 දිනැති පිඹුරේ සඳහන් ලොට් 02 දරන ඉඩමට, මායිම් : උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : අංක 87/94 දරන පිඹුරේ කැබලි අංක 03 ද, දකුණට : අංක 42බී/89 දරන පිඹුරේ කැබලි අංක ඊ සහ පුත්තලම පාර ද, බස්නාහිරට : අංක 87/94 දරන පිඹුරේ කැබලි අංක 01 ද යන මෙකී මායිම් තුළ වූ පර්චස් අටක් (අක්. 0, රූඩ් 0, පර් 08) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පලතුරු ගොඩනැගිලි ආදී සෑම සියළු දේ ද සමග වේ. (ඒ/1544/71 - කුරුණෑගල)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(වයඹ කලාපය).

2008 ජුනි මස 11 වැනි දින,
මහජන බැංකුව,
වයඹ කලාප කාර්යාලය,
නො. 210, කොළඹ පාර,
වැහැර,
කුරුණෑගල.
04-550

පී වී 60981.

2007 අංක 07 දරන සමාගම් පනත

394(3) වගන්තිය යටතේ "පැන් මැරින් ලොජිස්ටික් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2007.08.10 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "පැන් මැරින් ලොජිස්ටික් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "පැන් මැරින් ලොජිස්ටික් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරි ඉටුකිරීම).

2013 මාර්තු මස 27 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.
04 -512

පීවී 60152.

2007 අංක 07 දරන සමාගම් පනත

